**විශේෂ සටහන 19**

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2005 - 2006 (අ)

### මූර්ත අංශය

| | | |
|---|---|---|
| 2005 ජනවාරි 04 | - | මූලික පුහුණු වැඩ සටහනට සහභාගි වූ 42,588 ක්වූ උපාධිධාරීන් විධිමත් පුහුණුව සඳහා අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. |
| 2005 ජනවාරි 04 | - | ශ්‍රී ලංකා දුම්රිය සේවය යළි පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය අහෝසි කිරීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| 2005 මාර්තු 15 | - | සේවා නියුක්තයන්ගේ සේවය අත්හිටුවීමේ (විශේෂ විධිවිධාන) සංශෝධිත පනත යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් නව වන්දි සූත්‍රය ගැසට් පත්‍රිකාවක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2005 මාර්තු 30 | - | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් දියුණු කිරිම පිණිස රජය විසින් නව බැංකුවක් ස්ථාපිත කරන ලදී. |
| 2005 අප්‍රේල් 01 | - | රජය විසින්, රජයේ සේවකයන් සඳහා නව නිවාස ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. |
| | - | පොහොර සහනාධාරය මෙට්‍රික් ටොන් එකකට රුපියල් 23,000 සිට මෙට්‍රික් ටොන් එකකට රුපියල් 22,000 දක්වා අඩු කරන ලදී. |
| 2005 මැයි 04 | - | පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක් සඳහා වන සිල්ලර මිල ගණන් රුපියල් 74.00 ක්, රුපියල් 46.00 සහ රුපියල් 28.50 දක්වා පිළිවෙළින් රුපියල් 6.00 කින්, රුපියල් 4.00 කින් සහ රුපියල් 3.00 කින් ඉහළ දමන ලදී. |
| 2005 ජූනි 01 | - | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ස්ථාපිත කරන ලදී. |
| 2005 ජූනි 05 | - | පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක් සඳහා වන සිල්ලර මිල ගණන් රුපියල් 80.00ක්, රුපියල් 50.00 ක් සහ රුපියල් 30.50 දක්වා පිළිවෙළින් රුපියල් 6.00 කින්, රුපියල් 4.00 කින්, සහ රුපියල් 2.00 කින් ඉහළ දමන ලදී. |
| 2005 ජූනි 10 | - | මගී බස් ගාස්තු සියයට 15 කින් වැඩි කරන ලදී. |
| 2005 ජූනි 23 | - | පොල් ඉඩම් කට්ටි කිරීම සීමා කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| 2005 ජූලි 08 | - | සෞන්දර්ය අධ්‍යාපන ආයතනය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2005 ජූලි 13 | - | ශ්‍රී ලංකාව තුළ ඩෙන්ඩ්‍රෝ (dendro) බලශක්ති භාවිතය සංවර්ධනය කිරීමේ අරමුණින් බලශක්ති සඳහා යොදා ගත හැකි වැවිලි භෝග ඇති කිරීම සඳහා ග්ලිරිසීඩියා ශාකය හතර වන වැවිලි භෝගය වශයෙන් හඳුන්වා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 2005 අගෝස්තු 01 | - | දුම්රිය ගාස්තු සියයට 50 කින් පමණ වැඩි කරන ලදී. |
| 2005 අගෝස්තු 10 | - | මෙට්‍රික් ටොන් එකක් සඳහා රුපියල් 22,000 ක් වූ පොහොර සහනාධාරය රුපියල් 23,000 දක්වා ඉහළ දමන ලදී. |
| | - | පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම සහ පොල් කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා කප්රුක අරමුදල් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| 2005 අගෝස්තු 30 | - | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| 2005 සැප්තැම්බර් 28 | - | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නැවත පිහිටුවන ලදී. |

(අ) 2005 වසර තුළදී සහ 2006 වසරේ මුල් මාස හතර තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙන්ම 2006 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ගද ඇතුළත් වේ.

2005 නොවැම්බර් - ස්වාභාවික විපත් සිදුවන සියලුම ප්‍රදේශයන්හි රජයේ ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා පහසුකම් සැලසීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ඒජන්සිය (RADA) පිහිටුවන ලදී.

2005 දෙසැම්බර් 05 - වී සහ එළවළු ගොවීන් විසින් භාවිතා කරනු ලබන සියලුම පොහොර වර්ග කිලෝ ග්‍රෑම් 50 ක බෑගයක් රු. 350 ක මිලකට ලබා දීමට හැකිවන පරිදි පොහොර සහනාධාරය ඉහළ දමන ලදී.

2006 අප්‍රේල් 15 - පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක් සඳහා වන සිල්ලර මිල ගණන් රුපියල් 88.00 ක්, රුපියල් 58.00 ක් සහ රුපියල් 38.50 ක් දක්වා රුපියල් 8.00 බැගින් ඉහළ දමන ලදී.

## විදේශ අංශය

### වෙළෙඳ හා තීරු බදු

2005 ජනවාරි 01 - තෝරාගත් ද්‍රව්‍යයන් කිහිපයකට හැර, අනෙකුත් සියලුම ආනයන භාණ්ඩ සඳහා සියයට 10 ක් වූ රේගු අධිභාරය 2005 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

2005 ජනවාරි 03 - සහල් ආනයනයේදී ප්‍රදානය කළ කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 9.00 ක තීරු බදු අත්හැරීම් 2005 ජනවාරි 15 දක්වා දීර්ඝ කරන ලදී.

2005 මාර්තු 01 - 1979 අංක 40 දරන අපනයන සංවර්ධන මණ්ඩල පනතේ 14 වන වගන්තිය යටතේ 2004 නොවැම්බර් 04 වන දින පනවන ලද සෙස් බද්දට අමතරව බඩ ඉරිඟු, චොක්ලට් සහ ධාන්‍ය නිෂ්පාදන වැනි තෝරාගත් ආනයන ද්‍රව්‍ය සඳහා ආනයන සෙස් බද්දක් පනවන ලදී.

2005 ජූනි 01 - උසස් තාක්ෂණික කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට නව යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීම වෙනුවෙන් බදු නිදහස් කෙරෙන ක්‍රමයක් උසස් තාක්ෂණික සහ ජාතික ව්‍යවසායක සංවර්ධන අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලදී.

2005 ජූනි 12 - පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වීම ආරම්භ විය.

2005 ජූනි 30 - තිරිඟු ඇට සඳහා සියයට 2.5 ක් සහ තිරිඟු පිටි සඳහා සියයට 15 ක් වූ ආනයන බදු අත්හැරීම් ඉවත් කරන ලදී.

2005 ජූලි 1 - යුරෝපා සංගමය (EU) විසින් හඳුන්වා දෙනු ලැබූ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ සහන ලබා ගැනීමට ශ්‍රී ලංකාව සුදුසුකම් ලැබීය.

2005 අගෝස්තු 04 - බර වාහන ආනයනය මත පනවා තිබූ සියයට 27.5 ක රේගු බද්ද සියයට 6 දක්වා අඩු කරන ලදී.

- තිරිඟු පිටි ආනයනය මත පනවා තිබූ සියයට 2.5 ක ආනයන තීරු බදු සියයට 15 දක්වා හෝ කිලෝ ග්‍රෑමයකට රු. 4.50 (දෙකෙන් වැඩි අගය) දක්වා වැඩි කරන ලදී.
- සහල් ආනයනය මත පනවා තිබූ කිලෝ ග්‍රෑමයකට රුපියල් 9.00 ක් වූ තීරු බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 20.00 දක්වා වැඩි කරන ලදී.

2006 අප්‍රේල් 01 - සිලින්ඩර් ධාරිතාවය 1500ට වඩා අඩු මෝටර් කාර් ආනයනයේදී සියයට 25 ක බදු අත්හැරීමක් නියමානුකූල බදු ගෙවන්නන්හට ප්‍රදානය කරන ලදී.

### විදේශ විනිමය කළමනාකරණය

2005 ජනවාරි 03 - අපනයන ආදායම් නැවත සියරට එවීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

2005 පෙබරවාරි 14 - සුනාමි ව්‍යසනයෙන් පසු රජයට, රාජ්‍ය නොවන සංවිධානවලට සහ අනෙකුත් පුද්ගලයන්ට ලැබුණු ප්‍රේෂණ අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමයක් හඳුන්වා දුන් අතර එම ප්‍රේෂණ ගිණුම්ගත කිරීම සඳහා "පශ්චාත් සුනාමි ප්‍රේෂණ ලැබීම් ගිණුම" (Post-Tsunami Inward Remittances Account) නමින් විශේෂ ගිණුමක් හඳුන්වා දෙන ලදී.

2005 පෙබරවාරි - විද්‍යුත් විනිමය හුවමාරු කාඩ්පත් (Electronic Fund Transfer Cards) අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම පිණිස, එම කාඩ්පත්වලින් විදේශ විනිමය ආපසු ලබාගැනීම අධීක්ෂණය

සඳහා පවතින ක්‍රමය ශක්තිමත් කිරීමට සුදුසු ක්‍රියා මාර්ග නිර්දේශ කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කමිටුවක් පත් කරන ලදී.

**2005 අප්‍රේල් 08** - වක්‍ර අපනයනකරුවන්ට සෘජු අපනයනකරුවන්ගෙන් විදේශ මුදල්වලින් ගෙවීම් ලබා ගැනීමට අවසර දෙමින් වක්‍ර අපනයනකරුවන්ගේ විදේශ විනිමය ගිණුම් ක්‍රමය (IEFCAs) හඳුන්වා දෙන ලදී.

**2005 ජුනි 01** - විදේශ මුදල් හුවමාරුකරන්නන්ගේ කටයුතු ශක්තිමත් කිරීම හා මනා පාලනය සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග හඳුන්වා දෙන ලදී.

- විදේශ මුදල් හුවමාරු කරන්නකුවීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන නිකුත් කළ හා ගෙවා නිමකළ අවම ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂයේ සිට රුපියල් දශ ලක්ෂ 10 දක්වා ඉහළ දැමීම.
- විදේශ මුදල් මාරුකරන්නකු වශයෙන් අඛණ්ඩව කටයුතු කරගෙනයාම සඳහා අවශ්‍යවන නිකුත් කළ සාමාන්‍ය මාසික පිරිවැටුම එ.ජ.ඩොලර් 5,000 සිට එ.ජ.ඩොලර් 10,000 හෝ ඒ හා සමාන අනෙකුත් පරිවර්තිය මුදල් වටිනාකම් දක්වා වැඩි කිරීම

**2005 සැප්තැම්බර් 23** - ජාත්‍යන්තර විද්‍යුත් ණය කාඩ්පත්, හර කාඩ්පත් හෝ වෙනත් ඕනෑම අරමුදල් හුවමාරු කාඩ්පතක් මගින් කරනු ලබන විදේශීය මුදල් ආපසු ලබා ගැනීම් සඳහා අධීක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

## රාජ්‍ය මූල්‍ය අංශය

**රජයේ ආදායම**

**2005 ජනවාරි 1** - තෝරාගත් අයිතමයන් සඳහා සියයට 18 ක් වන නව එකතු කළ අගය මත බදු අනුපාතයක් පනවන ලදී.

- කෘෂිකාර්මික බීජ සහ පැලැටි, ත්‍රිරෝද රථ කල් බදු ක්‍රමයට ගැනීම, කොටස් වෙළෙඳපොළ ගනුදෙනු මත වන මූල්‍ය සේවා, සත්ත්ව ආහාර, ඉස්සන් සඳහා වන ආහාර සහ ග්‍රාමීය ප්‍රදේශ සඳහා විදුලි බලය සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- මැණික් සහ රන් සියයට 15 ක එකතු කළ අගය මත බදු අනුපාතයකට යටත් කරන ලදී.
- මැණික්, රන් සහ ස්වර්ණාභරණ අලෙවියෙන් ලබන ආදායම් සඳහා ලබාදී තිබූ ආදායම් බදු නිදහස ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, මැණික්, රන් හා ස්වර්ණාභරණ අපනයනයෙන් ලබන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- දේශීය හෝ ආනයනය කරන ලද භාණ්ඩ අලෙවි කරන්නේද යන්න නොසලකමින් තොග සහ සිල්ලර වෙළෙඳමට පනවා ඇති ආර්ථික සේවා ගාස්තු (ESC) අනුපාතය සියයට 1 සිට සියයට 0.5 දක්වා අඩුකරන ලදී.
- ඉඩමක ඕනෑම බෝග වර්ගයක් වගා කිරීම සහ එසේ වගා කළ ද්‍රව්‍ය සකස් නොකළ නිෂ්පාදන ලෙස අලෙවි කිරීම තුළින් ලබා ගන්නා ආදායම/ලාභ, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- සකස් කර අපනයනය කිරීම සඳහා කරනු ලබන ආනයන මත වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු (PAL) අනුපාතය සියයට 0.5 සිට සියයට 0.25 දක්වා අඩු කරන ලදී.
- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත, සුරාබදු ආඥාපනත (52 වන පරිච්ඡේදය), රේගු බදු ආඥා පනත (235 වන පරිච්ඡේදය) සහ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත (රඳවා තබා ගැනීමේ බදු සහ ලාභාංශ බදු හැර) යන පනත්වලට අනුව එකතු කරනු ලබන බදු හා ගාස්තු මත සියයට 0.25 ක සමාජීය වගකීම් ගාස්තුවක් (Social Responsibility Levy) පනවන ලදී.
- කොළඹ කොටස් හුවමාරුව හරහා සිදුකරනු ලබන සියලුම කොටස් ගනුදෙනු සඳහා සියලුම ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ පිරිවැටුම මත සියයට 0.2 ක කොටස් ගනුදෙනු බද්දක් (Share Transaction Levy) පනවන ලදී.
- ඉදිකිරීම් ඇප සහතික අරමුදල් බද්දක් පහත සඳහන් පරිදි පනවන ලදී.
  - රුපියල් දශ ලක්ෂ 15 සහ රුපියල් දශ ලක්ෂ 50 අතර වන සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා, ව්‍යාපෘති වටිනාකම මත සියයට 0.25 බද්දක්

- රුපියල් දශ ලක්ෂ 50 සහ රුපියල් දශ ලක්ෂ 150 අතර වන සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වටිනාකම මත සියයට 0.5 ක බද්දක්
- රුපියල් දශ ලක්ෂ 150 කට වඩා වැඩි සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වටිනාකම මත සියයට 1 ක බද්දක්

- හිඟ බදු අයකර ගැනීම සඳහා සහ බදු අනුකූලතා නොදක්වන අවස්ථා සම්බන්ධ නඩු ඇතුළුව බදු සම්බන්ධ නඩු සමථයකට පත් කිරීම කඩිනම් කිරීමේ අරමුණින්, ගම්පහ, මහනුවර, ගාල්ල සහ අනුරාධපුරය යන ස්ථානවල බදු පිළිබඳ නඩු සඳහාම කැපවූ උසාවි හතරක් පිහිටුවන ලදී.

- තක්සේරුකරුවන් විසින් එවනු ලබන තක්සේරුවලට එරෙහිව බදු ගෙවන්නන් විසින් යොමුකරනු ලබන අභියාචනා සම්බන්ධව කටයුතු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ අභියාචනා ඒකකයක් පිහිටුවන ලදී.

**2005 පෙබරවාරි 8**

- පහත සඳහන් පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.
  - මුදල් පනත් කෙටුම්පත (2005 අයවැය මගින් යෝජිත ක්‍රියා මාර්ග නීත්‍යානුකූල කිරීම සඳහා)
  - දඩ මුදල් වැඩි කිරීමේ පනත
  - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත (2005 වසරේ අයවැය මගින් යෝජිත ක්‍රියාමාර්ග නීත්‍යානුකූල කිරීම සඳහා)

**2005 පෙබරවාරි**

- බදු ගෙවීම මඟහැරීම සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා සහ එමගින් බදු පැහැර හැරීම් නිරීක්ෂණය කිරීමේ ක්‍රමය ශක්තිමත් කිරීමේ අරමුණින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී.

**2005 අප්‍රේල් 01**

- පුද්ගල ආදායම් බදු අනුපාත පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

  (1) පළමු රුපියල් 300,000 - නැත
  (2) ඊළඟ රුපියල් 300,000 - සියයට 5
  (3) ඊළඟ රුපියල් 200,000 - සියයට 10
  (4) ඊළඟ රුපියල් 200,000 - සියයට 15
  (5) ඊළඟ රුපියල් 200,000 - සියයට 20
  (6) ඊළඟ රුපියල් 200,000 - සියයට 25
  (7) ඉතිරි ප්‍රමාණය - සියයට 30

- සේවා නියුක්තිකයන්ගේ සේවාන්ත ප්‍රතිලාභවලට අදළ බදු තල පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.
  - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වැනි අංශ වලින් ලැබෙන සේවාන්ත ප්‍රතිලාභ සම්බන්ධයෙන් දනට පවතින රුපියල් දශ ලක්ෂ 2 ක් වූ බදු නිදහස් ප්‍රමාණය අවුරුදු 20 කට වඩා වැඩි කාලයක් දයකත්වය ලබාදුන් සේවකයන්ට පමණක් අදළ කරන ලදී.
  - දයකත්ව කාලසීමාව අවුරුදු 20කට වඩා අඩු වනවිට බදු නිදහස් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1 කට සීමා කරන ලදී.
  - ඉතිරිය සඳහා පහත සඳහන් සහනදයී අනුපාත යටතේ බදු අය කෙරේ.

    (1) පළමු රුපියල් 500,000 - සියයට 5
    (2) ඊළඟ රුපියල් 500,000 - සියයට 10
    (3) ඉතිරිය - සියයට 15

- සියලුම හවුල් ව්‍යාපාරවල බෙදිය හැකි ලාභ සහ අනෙකුත් ආදායම් මත සියයට 10 ක බද්දක් පනවන ලදී.

- සාමූහික සහ සාමූහික නොවන යන දෙඅංශයටම අදළ වූ බදු ගණනය කිරීමේදී ලබා දුන් විවිධ අඩු කිරීම් සම්බන්ධයෙන් සීමාවන් පනවන ලදී.

| | |
|---|---|
| | - ශ්‍රී ලංකාව තුළ සංවර්ධනය කරන ලද පරිගණක මෘදුකාංග සඳහා අදාළ වූ ප්‍රාග්ධන දීමනා අනුපාතය, 2004/05 ඇගයීම් වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 25 සිට සියයට 100 දක්වා වැඩිකරන ලදී. |
| | - ඔට්ටු ඇල්ලීම සම්බන්ධ බදු සහ සූදු බදු ඉහළ දමන ලදී. |
| | - පරිපාලන ගාස්තු හා අයකිරීම් වැඩි කරන ලදී. |
| | - මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී රඳවාගැනීමේ බද්දක් පනවන ලදී. |
| | - කපාපු පොල් සඳහා වූ අපනයන සෙස් බද්ද මෙට්‍රික් ටොන් එකකට රුපියල් 1,000 සිට රුපියල් 2,000 දක්වා 2005 අප්‍රේල් 01 දින සිට වර්ෂ 3 ක කාලයක් සඳහා ක්‍රියාත්මක වන පරිදි වැඩි කරන ලදී. |
| 2005 අප්‍රේල් 9 | - සිගරට්වල දිග ප්‍රමාණය අනුව සිගරට් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී. |
| 2005 මැයි 11 | - විවිධ නීති යටතේ සිදුකරනු ලබන වැරදි සඳහා වන දඩ මුදල් ඉහළ දමන ලදී. |
| 2005 ජූලි 20 | - සුනාමියෙන් විපතට පත් ප්‍රදේශවල පුනරුත්ථාපන කටයුතුවල නියැළී සිටින ආයතන හෝ පුද්ගලයන්ට ලැබෙන ප්‍රදාන/මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ගෙවිය යුතු එකතුකළ අගය මත බදු සඳහා සහන ලබාදෙන ලදී. |
| 2005 අගෝස්තු 01 | - ඩීසල්, මුතු, දියමන්ති සහ වටිනා ගල් ආනයනයේදී අය කරන ලද සියයට '15 ක් වූ එකතු කළ අගය මත බද්ද ඉවත් කරන ලදී. |
| 2005 අගෝස්තු 02 | - එකතු කළ අගය මත සියයට 18 ක් වූ බදු අනුපාතය සියයට 20 දක්වා වැඩි කරන ලදී. |
| 2005 අගෝස්තු 04 | - වසර 5 කට වඩා පැරණි බර වාහන ආනයනය සඳහා ගෙවිය යුතු නිෂ්පාදන බද්ද සියයට 100 කින් ඉහළ දමන ලදී. |
| 2005 අගෝස්තු 05 | - කිරිපිටි සඳහා සියයට 5 ක් සහ ගෑස් සඳහා සියයට 15 ක් වූ එකතු කළ අගය මත බද්ද ඉවත් කරන ලදී. |
| 2005 සැප්තැම්බර් 15 | - ස්වාධීන බදු ඔම්බුඩ්ස්මන්වරයකු පත්කරන ලදී. |
| 2005 නොවැම්බර් 02 | - නියමානුකූල බදු ගෙවන්නන් සඳහා වරප්‍රසාද කාඩ්පත් (Privilege Cards) නිකුත් කිරීම ආරම්භ කරන ලදී. |
| 2005 නොවැම්බර් 08 | - සිගරට්වල දිග ප්‍රමාණය අනුව සිගරට් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී. |
| | - මත්පැන් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී. |
| 2005 නොවැම්බර් 26 | - පරිගණක සහ පරිගණක අමතර කොටස්, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර ආනයනය සඳහා වූ එකතු කළ අගය මත බදු සහ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත අංශයේදී යොදගනු ලබන යන්ත්‍ර, නූල් හෝ ඩයි වර්ග එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2005 දෙසැම්බර් 23 | - සහල් ඇඹරීමේ යන්ත්‍ර ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2006 ජනවාරි 01 | - වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 1.5 සිට සියයට 2.5 දක්වා වැඩි කරන ලදී. |
| | - සමාජීය වගකීම් ගාස්තු (Social Responsibility Levy) අනුපාතය සියයට 0.25 සිට සියයට 1 දක්වා වැඩි කරන ලදී. |
| | - මූල්‍ය සේවා සඳහා වන එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 20 දක්වා වැඩි කරන ලදී. |
| | - ඖෂධීය ගුණයෙන් යුතු දේශීයව නිෂ්පාදනය කරනු ලබන ජින්ජර් බියර්, පේයාව සහ නෙල්ලි වැනි බීම වර්ග සඳහා එකතු කළ අගය මත බදු සියයට 20 සිට සියයට 15 දක්වා අඩුකරන ලදී. |

- මත්පැන් අලෙවිසැල් සඳහා අය කරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව ඉහළ දමන ලදී.
- ටවර්හෝල් පදනම මගින් කරනු ලබන සේවා, ලංකාව තුළ වගා කරනු ලබන ධාන්‍ය වලින් සකස් කරන ලද ආහාර, ආබාධිත පුද්ගලයන් භාවිතා කරනු ලබන උපකරණ සහ ශ්‍රී ලංකා ධජය යටතේ ලියාපදිංචි කර ඇති නැව් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- කිරි සැකසුම් යන්ත්‍ර සහ සකස් නොකරන ලද ලී කොටන් එකතුකළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් පිටත පිහිටුවන නව කර්මාන්ත සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර සහ උපකරණ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- සියලුම ජාත්‍යන්තර ක්‍රීඩා තරග ආදායම් බදු වලින් නිදහස් කරන ලදී.
- එකතු කළ අගය මත බදු ගණනය කිරීමේදී පිරිවැය, රක්ෂණ හා ගැල් කුලී ඇතුළත් මිලට (CIF Price) රේගුවේදී එකතු කරනු ලබන ආන්තිකය (Markup) සියයට 5 සිට සියයට 7 දක්වා වැඩි කරන ලදී.
- අපනයනකරුවන්ට බදු ප්‍රතිදාන ලබා දීම සඳහා නියම කර ඇති කාල සීමාව දින 30 සිට දින 15 දක්වා අඩුකරන ලදී.
- ඇඟලුම් පංගු මණ්ඩලයෙහි ලියාපදිංචි සෘජු අපනයනකරුවන්ට ලබාදී තිබූ එකතු කළ අගය මත බදු තාවකාලිකව නතර කිරීමේ ක්‍රමය අපනයන භාණ්ඩ නිෂ්පාදන සඳහා යොදගනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා සහ සෘජු අපනයනකරුවන් විසින් ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සඳහා ද ලබාදෙන ලදී.

2006 අප්‍රේල් 01

- මුද්දර බද්ද නැවත හඳුන්වාදෙන ලදී.
- පුද්ගල ආදායම් බදු අනුපාත පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | පළමු රුපියල් 300,000 | - නැත | (2) | ඊළඟ රුපියල් 300,000 | - 5% |
| (3) | ඊළඟ රුපියල් 200,000 | - 10% | (4) | ඊළඟ රුපියල් 200,000 | - 15% |
| (5) | ඊළඟ රුපියල් 200,000 | - 20% | (6) | ඊළඟ රුපියල් 200,000 | - 25% |
| (7) | ඊළඟ රුපියල් 200,000 | - 30% | (8) | ඉතිරිය | - 35% |

- සාමූහික බදු ක්‍රමයට පහත සඳහන් සංශෝධනයන් හඳුන්වා දෙන ලදී.
  - සමුපකාර සංගම් සඳහා අදාළ සාමූහික බදු අනුපාතය සියයට 20 සිට සියයට 5 දක්වා අඩුකරන ලදී.
  - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ රුපියල් දශ ලක්ෂ 5 නොඉක්මවන බදු අයකළ හැකි ආදායම් මත බදු අනුපාතය සියයට 20 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී.
  - බදු අයකළ හැකි ආදායම රුපියල් දශ ලක්ෂ 5 ඉක්මවන සමාගම් සඳහා අදාළ බදු අනුපාතය සියයට 30 දක්වා ඉහළ දමන ලදී.
- සූදු සහ ක්ෂණික ලොතරැයි ව්‍යාපාරවලින් ලබන ආදායම් සහ ලාභ මත අය කෙරෙන සාමූහික බදු අනුපාතය සියයට 40 ක් ලෙස නියම කරන ලදී.
- කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්ගෙන් පිටත පිහිටුවන ලබන සමාගම් සඳහා අවුරුදු 5 - 10 දක්වා කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී

**රජයේ වියදම**

2005 ජනවාරි 05

- ආදායම් සීමාවන් නොසලකා සුනාමි ව්‍යසනයෙන් මියගිය සෑම පුද්ගලයකු වෙනුවෙන්ම රුපියල් 15,000 ක මුදලක් ලබාදීමට රජය තීරණය කරන ලදී.

2005 ජනවාරි 11

- සුනාමි ව්‍යසනයෙන් විපතට පත් පවුල්වල එක් පුද්ගලයෙකුට සතියකට රුපියල් 200 ක මුදල් දීමනාවක් සහ රුපියල් 175 ක් වටිනා වියළි ආහාර සලාකයක් ලබාදීමට රජය තීරණය කරන ලදී.

| | |
|---|---|
| | - සුනාමි ව්‍යසනයෙන් විපතට පත් පුද්ගලයන්ට මුළුතැන්ගෙයි උපකරණ මිලදී ගැනීම සඳහා එක් පවුලකට රුපියල් 2,500 බැගින් ලබාදීම ආරම්භ කරන ලදී. |
| 2005 ජනවාරි 17 | - සුනාමි ව්‍යසනයෙන් විපතට පත් ජනතාව සඳහා කලින් කලට දෙනු ලබන දීමනාවක් ලෙස එක් පවුලකට රුපියල් 5,000 ක් (තනි පුද්ගලයකු සහිත පවුලකට රුපියල් 2,500 ක්) රජයේ බැංකු ශාඛා හරහා ලබාදීම රජය විසින් ආරම්භ කරන ලදී. |
| 2005 අප්‍රේල් | - සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ජනතාවගේ නිවාස ගොඩනැගීම සඳහා සම්පූර්ණයෙන් විනාශ වූ නිවාසයකට රුපියල් 250,000 ක් හා අර්ධ වශයෙන් විනාශ වූ නිවාසයකට රුපියල් 100,000ක මුදලක් රාජ්‍ය බැංකු හරහා ලබාදීමේ කටයුතු ආරම්භ කරන ලදී. |
| **රජයේ ණය** | |
| 2005 පෙබරවාරි | - සුනාමි ව්‍යසනය හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීමට සහායවීම පිණිස, පැරිස් කණ්ඩායම් සාමාජිකයන් සහ අනෙකුත් ද්විපාර්ශ්වික ආධාර ලබාදෙන්නන් විසින් ණය සේවාකරණ ගෙවීම් පමා කිරීමට කටයුතු කරන ලදී. |
| 2005 අප්‍රේල් 18 | - මහ බැංකුව විසින් පහත සඳහන් නියමයන් නිකුත් කරන ලදී.<br>- ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 250 සිට රුපියල් දශ ලක්ෂ 300 අතර පවත්වාගෙන යන ප්‍රාථමික වෙළෙඳුන්ට තම ලාභයෙන් සියයට 25 ක් ලාභාංශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ඉඩ දීම.<br>- ප්‍රාග්ධන පදනම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රුපියල් දශ ලක්ෂ 300 ඉක්මවූ පසු උපයන ලාභවලින් අවම වශයෙන් සියයට 25 ක් විශේෂ සංචිතයකට වෙන් කිරීම ප්‍රාථමික වෙළෙඳුන්ට අනිවාර්ය කිරීම.<br>- පළමු පෙළ ප්‍රාග්ධනයෙන් සියයට 50 ක් දක්වා වූ දෙවන පෙළ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාමට ප්‍රාථමික වෙළෙඳුන්ට ඉඩදීම. |
| 2005 මැයි 14 | - ගනුදෙනුකරුවන්ට වැඩි පහසුකම් සැපයීම සඳහා ස්විෆ්ට් පණිවුඩ ක්‍රමය (SWIFT) වැඩි දියුණු කිරීමට සමගාමීව නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමයද වැඩි දියුණු කරන ලදී. |
| 2005 ජූලි 01 | - ප්‍රාථමික වෙළෙඳුන් සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් දශ ලක්ෂ 200 සිට රුපියල් දශ ලක්ෂ 250 දක්වා වැඩි කරන ලදී. |
| 2005 දෙසැම්බර් | - ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ නිර්නායකයන් (bench mark) ස්ථාපිත කරනු වස් ණය ශ්‍රේණිගත කිරීමේ ජාත්‍යන්තර ආයතන වලින් ශ්‍රී ලංකාවට ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමක් ලබාගන්නා ලදී. |
| 2005 දෙසැම්බර් 01 | - මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් හිමියන්ට, ඔවුනගේ ආයෝජන සම්බන්ධ තොරතුරු ඕනෑම වේලාවක අන්තර්ජාලය මගින් දනගැනීමට හැකිවන පරිදි ලංකා සෙකුවර් නෙට් (Lanka Secure Net) නමින් ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. |
| 2005 දෙසැම්බර් 14 | - පරිණත කාලය වසර 3 දක්වා වන දර්ශක හා සම්බන්ධ භාණ්ඩාගාර බැඳුම්කර (Index Linked Treasury Bonds) නිකුත් කරන ලදී. |
| 2005 දෙසැම්බර් 30 | - එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100 ක ඒකාබද්ධ ණයක් ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ලබා ගන්නා ලදී. |
| 2006 පෙබරවාරි 03 | - විදේශීය ව්‍යවහාර මුදල් වලින් දයක විය හැකි ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර (Sri Lanka Nation Building Bonds) අනේවාසික ශ්‍රී ලාංකිකයන්හට නිකුත් කිරීම ආරම්භ කරන ලදී. |
| **අපේක්ෂිත** | |
| 2006 ජූලි 01 | - ප්‍රාථමික වෙළෙඳුන් සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් දශ ලක්ෂ 250 සිට 300 දක්වා වැඩි කිරීම.<br>- ප්‍රාථමික වෙළෙඳුන් සඳහා අවදනම් ප්‍රාග්ධන අවශ්‍යතා රාමුව හඳුන්වාදීම.<br>- ණය නොගෙවා යළි ණය ලබා ගැනීමේ අවදනම අඩු කිරීම හා ද්විතියික වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ණය ඒකාග්‍රතා ක්‍රියාවලිය හඳුන්වාදීම. |

**මූල්‍ය අංශය**

| | |
|---|---|
| 2005 ජනවාරි 12 | - සුනාමි ව්‍යසනයෙන් බලපෑම් ඇති වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහායවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුසහන (SUSAHANA) ණය ක්‍රමය හඳුන්වා දෙන ලදී. |
| 2005 පෙබරවාරි 01 | - ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට ඉතිරි කිරීමේ තැන්පතු භාර ගැනීම සඳහා අවසර දෙන ලදී. |
| | - මූල්‍ය සමාගම්වල ඉතිරිකිරීමේ තැන්පතු සඳහා පොලී අනුපාතික සීමාවන් නියම කරන ලදී. |
| | - ඉතිරි කිරීමේ තැන්පතුවල පවතින ශේෂයෙන් සියයට 20 කට නොඅඩු ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් ලෙස තබාගත යුතු බවට ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට නියෝග කරන ලදී. |
| | - භාණ්ඩාගාර බිල්පත් හා අනෙකුත් සුරැකුම්පත් බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ හෝ ප්‍රාථමික වෙළෙඳුන් සමඟ තබා ගැනීමට ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට අවසර දෙන ලදී. මෙතෙක් ඔවුනට සුරැකුම්පත් තබා ගැනීමට අවසර දෙන ලද්දේ බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ පමණි. |
| | - ලංකා වාණිජ මණ්ඩලය මගින් නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් නොකරන ලද සඳුද සිට සිකුරාද දක්වා සතියේ ඕනෑම දිනක, ව්‍යාපාරික කටයුතු සඳහා වසා තැබීමට, ලියාපදිංචි මූල්‍ය සමාගම් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගෙන් අවසරය ලබාගත යුතු බවට නියෝගයක් නිකුත් කරන ලදී. මුලදී මේ සඳහා අවසර ලබාගත යුතු වූයේ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති තුමාගෙනි. |
| 2005 පෙබරවාරි 11 | - බලපත්‍රලාභී වාණිජ බැංකුවල අධ්‍යක්ෂකවරුනට සහ ඔවුන්ගේ සමීපතම ඥාතීන්ට ණය දීමේ සීමාව අනුමත සුරැකුම්වලට එරෙහිව රුපියල් 500,000 ක් ලෙස මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. |
| | - බැංකු අධ්‍යක්ෂකවරුනට සහ ඔවුන්ගේ සමීපතම ඥාතීන්ට, සුරැකුම් රහිතව ණය කාඩ්පත් යටතේ ණය ලබාදීමේ සීමාව රුපියල් 500,000 ක් ලෙස මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. |
| | - බැංකු පනතට කරන ලද සංශෝධන මගින්, බැංකුවලට ඉස්ලාමීය මූලධර්ම මත පදනම් බැංකු සේවා සැපයීමට අවසර ලබාදෙන ලදී. මෙම සේවාවන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන බැංකුවලට, එම බැංකු කටයුතු දනට පවත්නා විධිමත්කරණ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි සිදු කිරීමේ අවශ්‍යතාවය දක්වමින් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2005 පෙබරවාරි 18 | - අදාළ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ අත්සන් සහිතව මාසිකව හා කාර්තුමය වශයෙන් අනුකූලතා වාර්තා ඉදිරිපත් කිරීමට බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම. |
| 2005 මාර්තු 03 | - ඉදිරි වෙළෙඳ ගිවිසුම් යටතේ වී සහ අනෙකුත් බෝග මිලදී ගැනීම සඳහා ලබාදෙන ණය සීමාව රුපියල් දශ ලක්ෂ 25 සිට රුපියල් දශ ලක්ෂ 50 දක්වා වැඩිකරන ලදී. |
| 2005 මාර්තු 07 | - විදේශයන්හි සංස්ථාපනය කළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල කේවල ණයගැති සීමාව ගණනය කිරීමේ පදනම ලෙස මුලින් පැවැති අත්තිකාරම්වලින් සියයට 15 වෙනුවට ප්‍රාග්ධන අරමුදල් වලින් සියයට 30 ලෙස වෙනස් කරන ලදී. |
| | - 2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනතේ 42 වන වගන්තියට අනුව බැංකු අධ්‍යක්ෂ තනතුරු සඳහා ඔවුන්ගේ යෝග්‍යතාවය නිර්ණය කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබාදිය යුතු යයි නියම කරන ලදී. |
| 2005 අප්‍රේල් 12 | - බලපත්‍රලාභී වාණිජ බැංකුවල අවම කොටස් ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් දශ ලක්ෂ 500 සිට රුපියල් දශ ලක්ෂ 2,500 දක්වා ද බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (ප්‍රාදේශීය බැංකු හැර) අවම කොටස් ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් දශ ලක්ෂ 200 සිට රුපියල් දශ ලක්ෂ 1,500 ක් දක්වා ද වැඩිකරන ලදී. දනට පවත්නා බැංකු තම මූලික ප්‍රාග්ධනය ඉහත සඳහන් මට්ටමට වැඩි කළ යුතුය. එසේම ප්‍රාග්ධනය හිඟ බැංකුවලට එම හිඟයෙන් සියයට 50 ක් 2006 අවසානයේදී සපුරාගත යුතුය යන කොන්දේසිය මත වැඩිකළ ප්‍රාග්ධනය අත්පත්කර ගැනීම සඳහා 2007 වර්ෂය අවසානය තෙක් කාලය ලබාදෙන ලදී. |

2005 මැයි 11 - පවතින ලියාපදිංචි මූල්‍ය සමාගම් සඳහා පැනවිය යුතු අවම මූලික ප්‍රාග්ධනය සම්බන්ධයෙන් අධ්‍යයනය කර යෝජනා ඉදිරිපත් කිරීමට මහ බැංකුවේ නිලධාරීන්, මූල්‍ය සමාගම්වල සහ විගණකවරුන්ගේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කරන ලදී.

2005 මැයි 13 - ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 7.75 සහ සියයට 9.25 දක්වා පදනම් අංක 25 කින් ඉහළ නංවන ලදී.

2005 ජුනි 15 - ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 8.25 සහ සියයට 9.75 දක්වා පදනම් අංක 50 කින් ඉහළ නංවන ලදී.

2005 ජුලි 12 - අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සම්බන්ධයෙන්, ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට සංශෝධිත නියෝග නිකුත් කරන ලදී.

2005 ජුලි 20 - කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා විචක්ෂණ සම්මතයන් /මහ පෙන්වීම් කෙටුම්පත් කිරීම සඳහා මහ බැංකු අධිපතිතුමා විසින් කමිටුවක් පත් කරන ලදී.

2005 ජුලි 29 - බැංකුවල කේවල ණයගැති සීමාවෙන් පහත සඳහන් ණය පහසුකම් ඉවත් කිරීමට මුදල් මණ්ඩලය අනුමත කරන ලදී.

(i) ඉහළ ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ඇති (A ශ්‍රේණියේ) දේශීය හෝ ජාත්‍යන්තර බැංකුවක ඇප මත දෙන ණය හෝ ප්‍රධාන කාර්යාලය නිකුත් කොට ඇති ඇපයක්/බැඳීමක් (විදේශීය බැංකු සඳහා බැංකුවේ ප්‍රාග්ධනය මෙන් සියයට සියයක් (100%) දක්වා) මත ණය.

(ii) යටිතල පහසුකම් සංවර්ධනයට දෙන ලද ණය, ප්‍රාග්ධනය මෙන් සියයට පනහක් දක්වා නියම කරන ලද කොන්දේසිවලට යටත්ව.

- වැඩිකළ ප්‍රාග්ධනය වෙනුවෙන් විදේශීය බැංකු විසින් ගෙනෙන ලද නව ප්‍රාග්ධනය, විදේශ ව්‍යවහාර මුදල්වලින් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මුදල් මණ්ඩලය අනුමැතිය ලබාදෙන ලදී.

  - රැගෙන එනු ලබන නව ප්‍රාග්ධනයෙන් සියයට 50 ක උපරිමයක් දක්වා පමණක් විදේශ ව්‍යවහාර මුදලින් පවත්වා ගතයුතු අතර ඉතිරිය රුපියල් අරමුදල් බවට පරිවර්තනය කළ යුතුය.
  - රැගෙන එනු ලබන නව ප්‍රාග්ධනයෙන් සියයට 25 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී රහිත ගිණුමක පවත්වාගෙන යා යුතුය.
  - රැගෙන එනු ලබන නව ප්‍රාග්ධනයෙන් සියයට 25 ක් ආයෝජන මණ්ඩලයේ ආයතන සඳහා ණය දීමට පමණක් අක් වෙරළ බැංකු ඒකකවල රඳවා තබාගත යුතු අතර එසේ ණයට දිය නොහැකි ඕනෑම මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කළ යුතුය.

2005 සැප්තැම්බර් 12 - 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි වීමට නියමිත නව සමාගම් සතුව රුපියල් දශ ලක්ෂ 200 කින් යුත් නිකුත් කරන ලද හා ගෙවා නිම කරන ලද ප්‍රාග්ධනයක් පැවතිය යුතු බවට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

2005 සැප්තැම්බර් 13 - ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 8.50 සහ සියයට 10.00 දක්වා පදනම් අංක 25 කින් ඉහළ නංවන ලදී.

2005 සැප්තැම්බර් 20 - විස්තීරණ ගෙවීම් ක්‍රමයක් සඳහා නීති රීති ඇතුළත් ගෙවීම් සහ පියවීම් පද්ධති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

2005 සැප්තැම්බර් - බැංකු විසින් කාර්තුමය පදනම මත ප්‍රසිද්ධ කළයුතු මූල්‍ය වාර්තාවල සංශෝධිත ආකෘතියක් නිකුත් කරන ලදී. නව ආකෘතිය යටතේ 2005 වසරේ 3 වන කාර්තුවේ සිට බලපැවැත්වෙන පරිදි අක්‍රීය ණය, ප්‍රාග්ධන අවශ්‍යතාවය, ද්‍රවශීලතාවය, පොලී අනුපාත වෙනස, මෙහෙයුම් වියදම් සහ ලාභදායිත්වය වැනි තෝරාගත් ප්‍රධාන කාර්ය ඵල දර්ශක ප්‍රසිද්ධ කළ යුතුය.

2005 ඔක්තෝම්බර් 01 - ඉදිරි දතම ගනුදෙනු සඳහා වන දින සංඛ්‍යාව 10 සිට 31 දක්වා වැඩි කරමින් ලංකා සෙට්ල් පද්ධතියේ නීති සංශෝධනය කරන ලදී.

| | |
|---|---|
| 2005 දෙසැම්බර් 01 | - මූල්‍ය ව්‍යුත්පන්න (Financial Derivatives) හා සම්බන්ධ ගනුදෙනු සඳහා අදාළ වන සංශෝධිත නියෝග නිකුත් කරන ලදී. |
| 2005 දෙසැම්බර් 22 | - ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 8.75 සහ සියයට 10.25 දක්වා පදනම් අංක 25 කින් ඉහළ නංවන ලදී. |
| 2005 දෙසැම්බර් 28 | - කල් බදු සමාගම්වල අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය සම්බන්ධයෙන් වන 2005 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම ප්‍රාග්ධන) විධානය නිකුත් කරන ලදී. |
| 2005 දෙසැම්බර් 29 | - 2005 අංක 5 දරන මූල්‍ය සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය නිකුත් කරන ලදී. |
| | - 2005 අංක 6 දරන මූල්‍ය සමාගම් (ශාඛා/කාර්යාල විවෘත කිරීම/වැසීම) විධානය නිකුත් කරන ලදී. |
| | - 2005 අංක 1 දරන මූල්‍ය සමාගම් (ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර දීමේ) නියමයන් නිකුත් කරන ලදී. |
| 2006 ජනවාරි 30 | - 2006 අංක 1 දරන මූල්‍ය සමාගම් (අවම මූලික ප්‍රාග්ධන) විධානය නිකුත් කරන ලදී. මෙම විධානය අනුව සෑම මූල්‍ය සමාගමක්ම රුපියල් දශ ලක්ෂ 200 කට නොඅඩු ක්ෂය නොවූ මූලික ප්‍රාග්ධනයක් සෑම විටම පවත්වාගෙන යා යුතුය. |
| | - 2006 අංක 2 දරන මූල්‍ය සමාගම් (අවදනම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාත) විධානය නිකුත් කරන ලදී. |
| **අපේක්ෂිත** | |
| | - ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය තුළ වෙළෙඳපොළ අවදනම සඳහා ද ප්‍රාග්ධන පවත්වා ගැනීම හඳුන්වා දීම. |
| | - බැංකුවල ආයෝජන වර්ගීකරණ සහ තක්සේරු කිරීම සඳහා විචක්ෂණ සම්මතයන් හඳුන්වාදීම. |
| | - බැංකු පනතේ 72 වැනි වගන්තිය අනුව බැංකුවල අත්හල දේපළ වාර්තා කිරීමට විධානයන් නිකුත් කිරීම |